# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2274/34 – 2022 අප්‍රේල් 08 වැනි සිකුරාදා – 2022.04.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 96 දරන ආඥාව**

මගේ යොමු අංකය: LD/05/2010/MV/52-B.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 11/3/3/1/22/F.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමීත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 මාර්තු මස 24 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, ලග්ගල.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල පල්ලෙගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟල උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ, දේවාලදෙනිය (භූ. මූ. පි. 20) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ma/ LGG/2018/441 හා 2019.06.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් පහත නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – වට්ටක්කායාය සහ බතලයාය – ප්‍රමාණය: හෙක්. 3.4231**

උතුරට: කෝනාර මුදියන්සේලාගේ වත්තෙ ගෙදර වජිර චානක හිමිකම් කියන වට්ටක්කායාය සහ බතලයාය සහ මා ඔය; නැගෙනහිරට: හිමිකම් කියන්නා නොදන්නා මාතුවාගල සහ ඩබ්ලිව්. ජී. නිමල් කරුණාරත්න හිමිකම් කියන මාතුවාගල; දකුණට: ඩබ්ලිව්. ජී. නිමල් කරුණාරත්න හිමිකම් කියන මාතුවාගල, කැබලි අක්ෂර බී සහ පහලගෙදර සිරිසෝම හිමිකම් කියන වට්ක්කායාය

1A – G36566 – 20(2022/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සහ බතලයාය; බටහිරට: කෝනාර මුදියන්සේලාගේ ලලිත් වසන්ත කෝනාර හිමිකම් කියන වට්ටක්කායාය සහ බතලයාය සහ කෝනාර මුදියන්සේලාගේ වත්තෙ ගෙදර වජිර චානක හිමිකම් කියන වට්ටක්කායාය සහ බතලයාය.

02. **කැබලි අක්ෂර 'B' – වට්ටක්කායාය සහ බතලයාය – ප්‍රමාණය: හෙක්. 2.2983**

උතුරට: කෝනාර මුදියන්සේලාගේ ලලිත් වසන්ත කෝනාර හිමිකම් කියන වට්ටක්කායාය සහ බතලයාය සහ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: ඩබ්ලිව්. ජී. නිමල් කරුණාරත්න හිමිකම් කියන මාතුවාගල; දකුණට: ඩබ්ලිව්. ජී. නිමල් කරුණාරත්න හිමිකම් කියන මාතුවාගල සහ කේ. එම්. හීන්බණ්ඩා හිමිකම් කියන වට්ටක්කායාය සහ බලතයාය; බටහිරට: පහලගෙදර සිරිසෝම හිමිකම් කියන වට්ටක්කායාය සහ බතලයාය.

EOG 04 - 0051

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.